# සංචාරක කර්මාන්ත

යක්කලමුල්ල ප්‍රාදේශිය ලේකම් කොට්ඨාසයේ දැනට ශ්‍රී ලංකා සංචාරක මණ්ඩලයේ අනුමැතිය ලත් එකම නිවාඩු නිකේතනයවූ "හරීෂා" නිවාඩු නිකේතනය යක්කලමුල්ල නගරය ආසන්නයේ පිහිටා ඇත. එය කාමර ශාලා පහසුකම් හා පිහිනුම් තටාකයක් සහිත නිවාඩු නිකේතනයකි.

මධ්‍යම පරිමාණයේ සංචාරක හෝටල් කිහිපයක්ද පිහිටා ඇත. චමුදි උත්සව ශාලාව, මල්සර ගෙස්ට් හවුස්, රසාරා ගෙස්ට් හවුස්, දූව උත්සව ශාලාව, වින්ඩි පොයින්ට් ජංගල් රිසෝට් නවාතැන් පොළ යක්කලමුල්ල නගරයට ඉතා ආසන්නව පිහිටා ඇත. එසේම කොට්ටව රක්ෂිත වනයටද ආසන්නව මෙම නිවාඩු නිකේතනයන් පිහිටා ඇති බැවින් එය සංචාරකයන්ට මහත් අස්වැසිල්ලක් වනවා ඇත.

විශේෂයෙන්ම යක්කලමුල්ල ප්‍රාදේශිය ස්වභාවික සෞන්දර්යය අතින් පොහොසත් ප්‍රදේශයකි. ප්‍රදේශයේ භූ විෂමතාවය හා ස්වාභාවික පිහිටීම සංචාරක කර්මාන්තයට ඉතා සුදුසුය. රජයේ රක්ෂිත වනාන්තර කිහිපයක්ම පිහිටා ඇති අතර විශේෂයෙන්ම කොට්ටව සදාහරිත වැසි වනාන්තරය ජෛව විවිධත්වය අතින් සුවිශේෂී ස්ථානයකි. මෙම වනාන්තරයේ අප රටටම ආවේනික වූ තුරුලතා මෙන්ම ඒක දේශීය වූ සත්ව වර්ග කිහිපයක්ම ජීවත්වේ. වන රක්ෂිත භූමිය ඇතුලත පිහිටා ඇති ස්වාභාවික නාන තටාකය මෙන්ම වනය තුළ දොළ පහරවල් රාශියක්ද ඇත.

| ඓතිහාසික වටිනාකමින් හා සංචාරක ආකර්ශනයක් පවතින ස්ථාන | | | |
|---|---|---|---|
| වසමේ අංකය | ග්‍රාම නිලධාරී වසම | නම | පවතින ස්ථානය |
| 176 | කොට්ටව | කොට්ටව රක්ෂිතය | කොට්ටව |
| 176 බී | කොට්ටව බටහිර | නාග ආරණ්‍ය සේනාසනය | කොට්ටවගම |
| 177 | තෙල්ලඹුර පහල | තෝම්හේන වත්ත | අකුලහේන |
| 177 ඒ | තෙල්ලඹුර ඉහළ | බෙත්තාරාම පුරාණ විහාරය | තෙල්ලඹුර |
| 177 බී | නාවල | ඇල්ල | ඇල්ලගාව |
| 177 සී | යක්කලමුල්ල | මළුවගොඩ ආරණ්‍ය සේනාසනය | මළුවගොඩ කන්ද |
| 177ඩී | යක්කලමුල්ල නැගෙනහිර | උඩුමලගල ගංගාරාම පුරාණ විහාරය | උඩුමලගල |
| 177 එෆ් | තෙල්ලඹුර දකුණ | කොඩිගල කන්ද | පිටියගොඩ වත්ත |
| 178 ඒ | නබදව | දූණුකිත්තල ආරණ්‍ය සේනාසනය | මලන්දෙණිය |
| 178 බී | මොරකැටිය | පත්තාරේ කැලය | පත්තාරේ |
| 180 බී | පොල්පාගොඩ බටහිර | ගල්ගේ කන්ද ආරණ්‍ය සේනාසනය | මානකඳුර |
| 181 | වල්පල | ගෞතමාරාම විහාරය | මායකඩුව |
| 181 සී | බදුංගල | ඓතිහාසික ගල්ගුහාව | යහලමුල්ල |
| 183 සී | උඩුබැට්ටව බටහිර | සංචාරක බංගලාව | වැවේගොඩවත්ත |

# කොට්ටව රක්ෂිත වනාන්තරය






